ශ්‍රී ලංකා මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනය දීර්ඝ කිරීමේ නිවේදනය

**ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා නිකුත් කිරීමේ පද්ධතිය සහ ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය සඳහා අදාළ Public Key Infrastructure (PKI) යටිතල පහසුකම් සංරචක ප්‍රසම්පාදනය**

**IFB අංකය : DIE/PRO/PKI/2025**

1. **"ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා නිකුත් කිරීමේ පද්ධතිය සහ ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය සඳහා අදාළ Public Key Infrastructure (PKI) යටිතල පහසුකම් සංරචක ප්‍රසම්පාදනය කිරීම"** සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනය **2025** ජූලි **30** දක්වා දීර්ඝ කරනු ලැබේ. පෙර ප්‍රකාශයට පත් කරන ලද නිවේදනය සහ වැඩිදුර තොරතුරු අපගේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැක. (www.immigration.gov.lk)

2. අප්‍රේල් 27 වන දින ප්‍රකාශයට පත් කරන ලද මුල් නිවේදනයේ සඳහන් සුදුසුකම් නිර්ණායක පහත සඳහන් පරිදි වෙනස් කර ඇත.

   **සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තුවේ සුවිශේෂී පළපුරුද්ද: 2. ආ) ii**

   "ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර ව්‍යාපෘතිය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන දහයක (10ක) අවම වටිනාකමකින් යුත් **Public Key Infrastructure** විසඳුමක් ඇතුළත්ව අවම වශයෙන් ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය කිරීමේ එක් විසඳුමක්වත් ලංසුකරු විසින් ලබා දී හෝ ක්‍රියාත්මක කර හෝ තිබිය යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයට පෙර පසුගිය වසර පහ (05) තුළ ව්‍යාපෘති සම්පූර්ණ කර හෝ ක්‍රියාත්මක වී තිබිය යුතු අතර එකී ව්‍යාපෘතිය ලංසුකරු විසින් ක්‍රියාත්මක කරන ලද නිකුත් කිරීමේ සේවා ව්‍යාපෘතියක් විය යුතුය."

3. **2025 ජූලි 30 දින ප.ව. 2.00** ට හෝ ඊට පෙර **05 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයට ලංසු එවිය යුතුවේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප වනු ඇත. ලංසු බාර ගෙන අවසන් වූ වහාම 2025 ජූලි 30 වන දින පස්වරු 2.00 ට පැමිණීමට තෝරා ගන්නා ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.


**සභාපති,**
උසස් මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව (HLPC)
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
5 වන මහල,
"සුහුරුපාය",
ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

2025 ජූලි 03